# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2270/88 - 2022 මාර්තු මස 12 වැනි සෙනසුරාදා - 2022.03.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : BDD/LND/02/139-2020-11.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/14/2020/CEB/86.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ(සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර :*

දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ බද්දේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 220ඒ ගනේගම නැගෙනහිර ග්‍රාම නිළධාරී කොට්ඨාසයේ වල්පිට උතුර ගමේ පිහිටි ගාල්ල ජ්‍යෙෂ්ඨ මැනුම් අධිකාරීගේ අංක ගා/4574 හා 2022.02.17 දිනැති මූලික පිඹුරේ සවිස්තරව දක්වා ඇති පහත විස්තර සඳහන් ඉඩම් කැබැල්ල වේ.

01. කැබලි අංක 01

ඉඩමේ නම: ඉදිගස්කැටිගොඩ හෙවත් ඔලිම්පස් වතුයායේ රිවර්සයිඩ් කොටස; විස්තරය: ගෙවත්ත, අවු. 5-8 පමණ වන පොල් ගස් 1 සහ මිශ්‍ර වගාවක් ඇත; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් කියන්නා:ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව;ප්‍රමාණය: හෙක්ටයාර් 0.0061.

02. කැබලි අංක 02

ඉඩමේ නම: ඉදිගස්කැටිගොඩ හෙවත් ඔලිම්පස් වතුයායේ රිවර්සයිඩ් කොටස; විස්තරය: ගෙවත්ත; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් කියන්නා:ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව;ප්‍රමාණය: හෙක්ටයාර් 0.0067.

03. කැබලි අංක 03

ඉඩමේ නම: ඉදිගස්කැටිගොඩ හෙවත් ඔලිම්පස් වතුයායේ රිවර්සයිඩ් කොටස; විස්තරය: ගෙවත්ත; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් කියන්නා:ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව;ප්‍රමාණය: හෙක්ටයාර් 0.0489.

04. කැබලි අංක 04

ඉඩමේ නම: ඉදිගස්කැටිගොඩ හෙවත් ඔලිම්පස් වතුයායේ රිවර්සයිඩ් කොටස; විස්තරය: වත්ත, අවු. 30 -35 පමණ වන රබර්

ගස් 215 වගාවක් ඇත.; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් කියන්නා:ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව;ප්‍රමාණය: හෙක්ටයාර් 1.8216.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2022 මැයි මස 25 වැනි දින පෙරවරු 10.30 ට බද්දේගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2022 මැයි මස 30 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම/පරවශ්‍යතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

ඩබ්.එස්.සත්‍යානන්ද,
ප්‍රාදේශීය ලේකම්,
බද්දේගම කොට්ඨාසය.

2022 මාර්තු මස 09 වැනි දින,
බද්දේගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 03 - 0866

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.